ප්‍රතිශත

Nipuna Sameera
0763446747

1. ලාභය සහ අලාභය

වෙළෙඳුන් විකුණන්නේ තමන් නිෂ්පාදනය කරන හෝ වෙනත් අයකුගෙන් මිල දී ගත් භාණ්ඩ ය. එසේ මිලදී ගැනීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේදී යම් වියදමක් දැරීමට සිදු වේ. එසේ වියදමක් දරා ලබා ගත් භාණ්ඩයක් සාමාන්‍යයෙන් විකුණනු ලබන්නේ එම දැරීමට සිදු වූ වියදමට වඩා වැඩි මිලකට ය. එසේ විකිණීමේ දී වෙළෙන්දාට එම වෙළෙඳාමෙන් **"ලාභයක්"** ලැබේ යැයි කියනු ලැබේ.

සැම විටම වෙළෙන්දාට තම භාණ්ඩ ලාභ සහිතව විකිණීමට හැකි නොවේ. නිදසුන් ලෙස භාණ්ඩ පළුදු වීම හෝ කල් ඉකුත් වීමට ආසන්න වීම නිසා එම භාණ්ඩ සඳහා වියදම් වූ මුදලට වඩා අඩු මුදලකට විකිණීමට සිදුවේ. එසේ විකිණීමේ දී එම වෙළෙඳාමෙන් වෙළෙන්දාට **"අලාභයක්"** සිදු වේ යැයි කියනු ලැබේ.

වෙළෙන්දාට යම් භාණ්ඩයක් ලබා ගැනීම සඳහා යෙදවූ මුදලටම එම භාණ්ඩය විකිණුවහොත් වෙළෙන්දාට එහිදී ලාභයක් හෝ අලාභයක් සිදු වී නැත.

1.1 ගත් මිල

වෙළෙන්දා භාණ්ඩයක් මිල දී ගැනීමට වැය කරන මුදල "ගත් මිල" ලෙස හැඳින්වේ.

සමාන තේරුමක් ඇති පද

මිල දී ගත් මිල / ගත් මිල / වියදම් වූ මුදල / වැය කල මුදල / නිෂ්පාදන වියදම / නිෂ්පාදිත මිල / නිෂ්පාදනය කිරීමට වැය කල මුදල

1.2 වික්ක මිල

වෙළෙන්දා භාණ්ඩයක් විකුණන මිල හෝ විකිණීමෙන් ලද මුදල "වික්ක මිල" ලෙස හැඳින්වේ.

සමාන තේරුමක් ඇති පද

විකුණුම් මිල / විකිණීමෙන් ලද මුදල / වික්ක මිල / විකුණූ මිල

Nipuna Sameera

1.3 ලාභය

විකුණුම් මිල > වියදම් වූ මුදල නම් ලාභයක් ලැබේ.

ලාභය = විකුණුම් මිල - වියදම් වූ මුදල

1.4 අලාභය

විකුණුම් මිල < වියදම් වූ මුදල නම් අලාභයක් ලැබේ.

අලාභය = වියදම් වූ මුදල - විකුණුම් මිල

අභ්‍යාස

1. ලාභය සොයන්න.
   1.1. භාණ්ඩයක් රු. 2500 කට මිලදී ගත්තා. එය රු. 3000 කට විකුණන ලදී. ලාභය සොයන්න.
   1.2. වෙළෙන්දෙක් රු. 1200 කට ගත් පොත් තොගයක් රු. 1500 කට විකුණන ලදී. ලාභය සොයන්න.
   1.3. රු. 5000 කට ගත් බෑගයක් රු. 5750 කට විකුණන ලදී. ලාභය සොයන්න.

2. අලාභය සොයන්න.
   2.1. රු. 4000 කට ගත් භාණ්ඩයක් රු. 3500 කට විකුණන ලදී. අලාභය සොයන්න.
   2.2. රු. 2750 කට ගත් සපත්තු යුගලයක් රු. 2500 කට විකුණන ලදී. අලාභය සොයන්න.
   2.3. රු. 6000 කට ගත් දුරකථනයක් රු. 5400 කට විකුණන ලදී. අලාභය සොයන්න.

3. කොටස් වශයෙන් විකුණන ගැටළු

   3.1. වෙළෙන්දෙක් භාණ්ඩයක් රු. 40 බැගින් භාණ්ඩ 300 ක් මිල දී ගනී. පළමු දින භාණ්ඩ 180 ක් රු. 55 බැගින් විකුණයි. දෙවන දින ඉතිරි භාණ්ඩ රු. 50 බැගින් විකුණයි.
      3.1.1. එක් එක් දින ලාභය සොයන්න.

Nipuna Sameera

3.1.2. මුළු ලාභය සොයන්න.

3.2. වෙළෙන්දෙක් අඹ ගෙඩියක් රු. 25 බැගින් අඹ ගෙඩි 500 ක තොගයක් මිලදී ගනී. පළමු දින ඉන් 300 ක් රු. 35 බැගින් විකුණයි. ඉතිරි අඹ ගෙඩි තොගය රු. 30 බැගින් විකුණයි.

3.2.1. එක් එක් දින ලාභය සොයන්න.

3.2.2. මුළු ලාභය සොයන්න.

3.3. වෙළෙන්දෙක් එකක් රු. 55 බැගින් මිල දී ගත් පොල් ගෙඩි 100ක තොගයක්, එකක් රු. 65 බැගින් විකිනීමෙන් ඔහු ලැබූ ලාභය සොයන්න.

3.4. වෙළෙන්දෙක් රු. 60 බැගින් ගත් අඹ ගෙඩි 50ක තොගයක්, තැලීමට ලක් වීම නිසා එකක් රු. 50 බැගින් විකිණීමට සිදු විය. ඔහුට සිදු වූ අලාභය සොයන්න.

3.5. වෙළෙන්දෙක් රු. 50 බැගින් ගත් අඹ ගෙඩි 200ක තොගයකින් 185ක් රු.55 බැගින් විකුණයි. ඉතිරිය තැලීමට ලක් වූ නිසා රු. 40 බැගින් විකුණයි. ඔහු ලැබූ ලාභය/අලාභය සොයන්න.

4. ලාභය සහ අලාභය මිශ්‍ර ගැටළු

4.1. වෙළෙන්දෙක් පොල් ගෙඩියක් රු. 60 බැගින් පොල් 200 ක තොගයක් මිල දී ගනී. පළමු දින ඉන් 120 ක් රු. 75 බැගින් විකුණයි. දෙවන දින ඉතිරි පොල් තොගය රු. 50 බැගින් විකුණයි. එක් එක් දින ලාභය හෝ අලාභය සහ මුළු ලාභය හෝ අලාභය සොයන්න.

4.2. භාණ්ඩයක් රු. 100 බැගින් භාණ්ඩ 250 ක් මිලදී ගනී. පළමු දින 150 ක් රු. 120 බැගින් විකුණයි. ඉතිරි 100 ක් රු. 90 බැගින් විකුණයි. එක් එක් දින ලාභය හෝ අලාභය සහ මුළු ලාභය හෝ අලාභය සොයන්න.

5. විකිණිය යුතු මිල සොයන්න.

5.1. වෙළෙන්දෙක් රු. 1500 ට ගත් භාණ්ඩයක් රු. 2000ක ලාභයක් තබාගෙන විකිණිය යුතු මිල සොයන්න.

5.2. වෙළෙන්දෙක් රු. 4200 ට ගත් භාණ්ඩයක් විකිණීමෙන් රු. 1250ක අලාභයක් සිදු විය. එම භාණ්ඩය විකුණා ඇති මිල සොයන්න.

Nipuna Sameera

5.3. වෙළෙන්දෙක් එකක් රු. 250ට ගත් අන්නාසි 100 ක තොගයක් විකිණීමෙන් රු. 8000ක ලාභයක් ලැබීමට අපේක්ෂා කරයි නම්, එක් අන්නාසි ගෙඩියක් විකිණිය යුත්තේ කීයට ද?

5.4. වෙළෙන්දෙක් එකක් රු. 55ට පොල් ගෙඩි 150ක තොගයක් මිලදී ගනී. එක් පොල් ගෙඩියකින් රු. 10ක් ලාභ ලැබීමට ඔහු අපේක්ෂා කරයි. එක පොල් ගෙඩියක් විකිණිය යුතු මිල සහ මෙම පොල් තොගය විකිණීමෙන් ලබන මුළු මුදල, ලාභය සොයන්න.

2. ප්‍රතිශත

ප්‍රතිශතයක් යන්නෙන් “100 කින් කොපමණද” යන්න අදහස් වේ. ප්‍රතිශතයක් % ලකුණෙන් දක්වයි.

- 50% ක් යනු 100කින් 50ක් වේ.
- 25% ක් යනු 100කින් 25ක් වේ.

2.1 ප්‍රතිශතයක් භාගයක් ලෙස දැක්වීම

1. $25\% = \frac{25}{100} = \frac{1}{4}$

2. $30\% = \frac{30}{100} = \frac{3}{10}$

3. $57\% = \frac{57}{100}$

2.2 ප්‍රතිශතයක් දශම ලෙස දැක්වීම

1. $25\% = \frac{25}{100} = \frac{1}{4} = 0.25$

2. $30\% = \frac{30}{100} = \frac{3}{10} = 0.3$

Nipuna Sameera

3. $57\% = \frac{57}{100} = 0.57$

2.3 භාගයක් ප්‍රතිශතයක් ලෙස දැක්වීම

1. $\frac{4}{5} \Rightarrow \frac{4}{5} \times 100\% = 80\%$ $\frac{4}{5} \Rightarrow \frac{4 \times 20}{5 \times 20} = \frac{80}{100} = 80\%$

2. $\frac{3}{20} \Rightarrow \frac{3}{20} \times 100\% = 15\%$ $\frac{3}{20} \Rightarrow \frac{3 \times 5}{20 \times 5} = \frac{15}{100} = 15\%$

3. ලාභ අලාභ ප්‍රතිශත

රු. 2000ට ගත් භාණ්ඩයක් රු. 2500ට විකිණීම.

රු. 2000ට ලාභය ⟶ රු. 500

රු. 200ට ලාභය ⟶ රු. 50

රු. 100ට ලාභය ⟶ රු. 25 ⇒ 25%

රු. 100ට ගත් භාණ්ඩයක් විකිණීමෙන් ලැබෙන ලාභයේ හෝ අලාභයේ ප්‍රමාණය ගත් මිලෙහි ප්‍රතිශතයක් ලෙස දැක් වූ විට එය "**ලාභ හෝ අලාභ ප්‍රතිශතය**" ලෙස හැඳින්වේ.

රු. 2000ට ගත් විට ලාභය = රු. 500

රු. 1 ට ගත් විට ලාභය $= \frac{\text{රු. } 500}{\text{රු. } 2000}$

රු. 100ට ගත් විට ලාභය $= \frac{\text{රු. } 500}{\text{රු. } 2000} \times 100$

ලාභ ප්‍රතිශතය $= \frac{\text{රු. } 500}{\text{රු. } 2000} \times 100\ \%$

$$\text{ලාභ ප්‍රතිශතය} = \frac{\text{ලාභය}}{\text{ගත් මිල (නිෂ්පාදන වියදම)}} \times 100\%$$

Nipuna Sameera

$$\text{අලාභ ප්‍රතිශතය} = \frac{\text{අලාභය}}{\text{ගත් මිල (නිෂ්පාදන වියදම)}} \times 100\%$$

සැ.යු. - ලාභ හෝ අලාභ ප්‍රතිශතය ගණනය කිරීමේදී සැමවිටම ගත් මිල මත එය ගණනය කරයි.

අභ්‍යාස

1. ලාභ ප්‍රතිශතය සොයන්න.

   1.1. භාණ්ඩයක් රු. 2500 කට මිලදී ගත්තා. එය රු. 3000 කට විකුණන ලදී. වෙළෙන්දා ලබන ලාභය සොයා, ලාභ ප්‍රතිශතය සොයන්න.
   1.2. වෙළෙන්දෙක් රු. 1200 කට ගත් පොත් තොගයක් රු. 1500 කට විකුණන ලදී. ලාභ ප්‍රතිශතය සොයන්න.
   1.3. රු. 5000 කට ගත් බෑගයක් රු. 5750 කට විකුණන ලදී. වෙලෙන්දා ලබන ලාභ ප්‍රතිශතය සොයන්න.

2. අලාභ ප්‍රතිශතය සොයන්න.

   2.1. රු. 4000 කට ගත් භාණ්ඩයක් රු. 3500 කට විකුණන ලදී. වෙළෙන්දාට සිදු වූ අලාභය සොයා අලාභ ප්‍රතිශතය ගණනය කරන්න.
   2.2. රු. 2750 කට ගත් සපත්තු යුගලයක් රු. 2500 කට විකුණන ලදී. අලාභ ප්‍රතිශතය සොයන්න.
   2.3. රු. 6000 කට ගත් දුරකථනයක් රු. 5400 කට විකුණන ලදී. අලාභ ප්‍රතිශතය සොයන්න.

3. වඩා වාසිදායක වෙළෙඳාම

   3.1. වඩු කාර්මිකයෙක් මේසයක් රු. 4000ක් වියදම් කොට නිෂ්පාදනය කරයි. ඔහු එය රු. 5600ට විකුණනු ලබයි. ලෝහ කාර්මිකයෙක් රු. 250ක් වියදම් කොට තැනූ පිහියක් රු. 360ට විකුණයි. මෙහි දී වඩා වාසිදායක වෙළෙඳාමේ නිරත වූයේ කවුරුන් දැයි නිර්ණය කරන්න.
   3.2. කමල් රු.1500ක් වියදම් කර ලබාගත් භාණ්ඩයක් රු. 2000ට විකුණනු ලබයි. අමල් රු. 150ට ගත් භාණ්ඩයක් රු. 250ට විකුණනු ලබයි. දෙදෙනාගෙන් වැඩි ලාභයක් ලබන්නේ කවුරුන්ද?

4. විකිණුම් මිල සොයන්න.
   4.1. වෙළෙන්දෙක් රු.3000ට ගත් භාණ්ඩයක් 30% ක් ලාභ ලැබෙන සේ විකිණිය යුතු මිල සොයන්න.
   4.2. වෙළෙන්දෙක් රු.50000ක් වටිනා අල්මාරියක් 20%ක ලාභ ප්‍රතිශතයක් ලැබෙන සේ විකුණයි. විකිණුම් මිල සොයන්න.
   4.3. කමල් රු.4000ක් දී මිලදී ගත් අඹ ගෙඩි තොගයක් තැලීම නිසා 2%ක අලාභයක් සහිතව විකුණයි. විකුණුම් මිල සොයන්න.
5. ගත් මිල සොයන්න.
   5.1. වෙළෙන්දෙක් රූපවාහිනී යන්ත්‍රයක් රු.22000ට විකිණීමෙන් 10%ක ලාභයක් ලබයි නම්, වෙළෙන්දා එම රූපවාහිනිය ගත් මිල සොයන්න.
   5.2. වෙළෙන්දෙක් භාණ්ඩයක් 20%ක ලාභයක් ලැබෙන සේ රු.18000ට විකුණයි. ඔහු එය ගත් මිල (නිෂ්පාදන මිල) සොයන්න.

Nipuna Sameera

5.3. ක්‍රීඩා භාණ්ඩයක ඇති දෝෂයක් නිසා වෙළෙන්දෙකුට එය රු. 5800ට විකිණීමට සිදු විය. එයින් ඔහුට 15%ක අලාභයක් සිදු වේ. ඔහු එම ක්‍රීඩා භාණ්ඩය ගත් මිල සොයන්න.

4. වට්ටම් හා කොමිස්

භාණ්ඩයක් විකිණීමේ දී එම භාණ්ඩය විකිණීමට බලාපොරොත්තු වන මිල එම භාණ්ඩයේ "**ලකුණු කල මිල**" ලෙස හැඳින් වේ.

මෙලෙස භාණ්ඩ විකිණීමේ දී, සමහර අවස්ථාවන්හී දී වෙළෙඳුන් විකිණීමට ලකුණු කල මිලෙන් යම් කිසි මුදලක් අඩු කර භාණ්ඩය විකුණනු ලබයි. මෙලෙස අඩු කරන මුදල "**වට්ටම**" (Discount) ලෙස හැඳින්වේ.

මෙලෙස දෙනු ලබන වට්ටම, භාණ්ඩයේ ලකුණු කොට ඇති මිලෙන් ප්‍රතිශතයක් ලෙස දැක්වීම බොහෝ විට සිදු වේ.

රු. 500ට මිල ලකුණු කර ඇති භාණ්ඩයක් වික්ක මිල රු. 450කි.

රු. 500ට දෙනු ලබන වට්ටම = රු. 50

රු. 1 ට දෙනු ලබන වට්ටම $= \frac{\text{රු. } 50}{\text{රු. } 500}$

රු. 100ට දෙනු ලබන වට්ටම $= \frac{\text{රු. } 50}{\text{රු. } 500} \times 100$

වට්ටම් ප්‍රතිශතය $= \frac{\text{රු. } 50}{\text{රු. } 500} \times 100\ \%$

$$\text{වට්ටම් ප්‍රතිශතය} = \frac{\text{වට්ටම}}{\text{ලකුණු කල මිල}} \times 100\%$$

අභ්‍යාස

1. වට්ටම සොයන්න.

1.1. කවීශ රු. 1500 ක් වටිනා පොතක් 20%ක වට්ටමක් ලබා දෙන පොත් සාප්පුවකින් මිල දී ගනියි. ඔහුට ලැබෙන වට්ටම සොයන්න.

1.2. වෙළෙන්දෙක් රු. 1200 කට ගත් පොත් තොගයක් 15% ක වට්ටමක් සහිතව විකුණන ලදී. ඔහු ලබා දුන් වට්ටම සොයන්න.

Nipuna Sameera

1.3. වෙළෙන්දෙක් රු. 1200ට මිල ලකුණු කල භාණ්ඩයක් රු. 1050ට විකිණීමේදී පාරිභෝගිකයාට ලැබෙන වට්ටම සොයන්න.

2. වට්ටම් ප්‍රතිශතය සොයන්න.

2.1. රු. 4000 කට ගත් භාණ්ඩයක් රු. 3500 කට විකුණන ලදී. වෙළෙන්දා ලබා දුන් වට්ටම ගණනය කර වට්ටම් ප්‍රතිශතය සොයන්න.

2.2. රු. 3000ට මිල ලකුණු කල පොත් කට්ටලයක් මිලදී ගැනීමේ දී රු. 450ක වට්ටමක් ලබා දේ. නිමල් එම පොත් කට්ටලය මිල දී ගැනීමේ දී ඔහුට ලැබෙන වට්ටම් ප්‍රතිශතය සොයන්න.

2.3. රු. 6000 කට මිල ලකුණු කල දුරකථනයක් රු. 5400 කට විකුණන ලදී. ලබා දුන් වට්ටම් ප්‍රතිශතය සොයන්න.

3. විකුණුම් මිල සොයන්න.

3.1. වඩු කාර්මිකයෙක් මේසයක් රු. 10000කට මිල ලකුණු කර ඇති මේසයක් 10%ක වට්ටමක් ලබා දී විකුණයි. ඔහු එය වික්ක මිල සොයන්න.

3.2. රු. 5000ට මිල ලකුණු කර ඇති භාණ්ඩයක් 2%ක වට්ටමක් සහිතව විකුනන්නේ කීයට ද?

4. ලකුණු කල මිල සොයන්න.

4.1. වෙළෙන්දෙක් රු.3000ට භාණ්ඩයක් විකුණන්නේ එහි ලකුණු කල මිලෙන් 15% ක වට්ටමක් ලබා දීමෙන්ය. ලැබෙන වට්ටම හා භාණ්ඩය විකිණීමට ලකුණු කල මිල සොයන්න.

4.2. 8% ක වට්ටමක් සහිතව කතා පොතක් විකුණනු ලබන්නේ රු. 460ට නම් කතා පොත විකිණීමට ලකුණු කර ඇති මිල කොපමණ ද?

මිශ්‍ර අභ්‍යාස

1. වෙළෙන්දෙක් රු. 80000ක් වියදම් කොට නිෂ්පාදන කල අල්මාරියක් 20% ක ලාභයක් ලැබෙන සේ මිල ලකුණු කරයි. අත් පිට මුදලට ගැනීමේ දී 5%ක වට්ටමක් ලබා දීමට ඔහු අපේක්ෂා කරයි.

1.1. වෙළෙන්දා ලැබීමට බලාපොරොත්තු වන ලාභය කොපමණ ද?

1.2. වෙළෙන්දා අල්මාරිය විකිණීමට ලකුණු කල මිල කීය ද?

1.3. අත් පිට මුදලට ගැනීමේදී ලබාදෙන් වට්ටම කීය ද?

1.4. වෙළෙන්දා අල්මාරිය අත් පිට මුදලට විකුණුවේ නම්, ඔහු එය වික්ක මිල සොයන්න.

1.5. මෙම ගනුදෙනුවෙන් ඔහු ලැබූ සත්‍ය ලාභය සහ ලාභ ප්‍රතිශතය සොයන්න.

2. ජංගම දුරකථනයක නිෂ්පාදන වියදම රු. 9000ක් වේ. රු. 3000ක ලාභයක් ලැබෙන සේ එහි මිල ලකුණු කර ඇත. එහෙත් විකිණීමේ දී ලකුණු කල මිලෙන් 10%ක වට්ටමක් දෙනු ලැබේ නම්, භාණ්ඩයේ විකුණුම් මිල සොයන්න.

Nipuna Sameera

5. කොමිස්

ඉඩම්, නිවාස හා වාහන යන සමහර දෑ විකිණීමේ දී පුද්ගලයෙකුගෙන් හෝ ආයතනයක සහය ගැනීමට සිදු වේ. එවැනි ආයතන හෝ පුද්ගලයින් "තැරැව්කරුවන්" (Broker) ලෙස හැඳින්වේ. තැරැව්කරුවන් හරහා කිසියම් විකිණීමක් සිදු කිරීමේ දී එම විකුණුම් මුදලෙන් කිසියම් ප්‍රතිශතයක් ලෙස අය කරගන්නා මුදල "**කොමිස් මුදල**" ලෙස හැඳින් වේ.

අභ්‍යාස

1. දේපළ වෙළඳාමේ නිරත සමාගමක් 1200000 ක් වටිනා ඉඩමක් විකුණා දීමට රු. 36000 මුදලක් අය කරයි. අය කරන කොමිස් ප්‍රතිශතය සොයන්න.
2. 5% ක කොමිස් ප්‍රතිශතයක් අය කරන ආයතනයක් මගින් රු. 3000000 ක් වටිනා මෝටර් රථයක් විකුණා දීම සඳහා අය කරන කොමිස් මුදල සොයන්න.
3. 8% ක කොමිස් ප්‍රතිශතයක් අය කරන පුද්ගලයෙකු මාර්ගයෙන් රු. 800000 ක් වටිනා යතුරු පැදියක් විකුණන ලදී. ඔහුට ලැබෙන කොමිස් මුදල සොයන්න.

Nipuna Sameera